**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2019**

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය යටතේ ක්‍රියාත්මක වන බාහිර උපාධි පාඨමාලා**

1. <u>ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව</u>

**අ) කොටස ඃ ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්**

I. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වසරේ හෝ ඉන්පසු පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයන් තුනම එකවර සමත් වී තිබීම

හෝ

2000 වර්ෂයට පෙර අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට ඇත්නම් විෂයයන් හතරම එකවර සමත් වී තිබීම

හෝ

II. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගත් මතු දැක්වෙන වෘත්තීය හා වෙනත් සුදුසුකම්

i) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් උපාධියක් ලබා තිබීම
ii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හෝ ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන වසරකට නොඅඩු ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත් වීම (SLQF Level 3 / NVQ Level 5)
iii) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු සහතිකය ලබා තිබීම
iv) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන නීති පරීක්ෂණයෙන් සමත් වීම

**ආ) කොටස ඃ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව හැදෑරීමට විෂයයන් තෝරා ගැනීම**

| <u>සංකේත අංකය</u> | <u>විෂයය</u> |
|---|---|
| 01 | බෞද්ධ ශිෂ්ටාචාරය (Buddhist Civilization) |
| 02 | බෞද්ධ දර්ශනය (Buddhist Philosophy) |
| 03 | නර්තනය (Dancing) |
| 04 | නාට්‍ය හා රංග කලාව (Drama and Theatre) |
| 05 | ඉංග්‍රීසි (English) |

| | |
|---|---|
| 06 | සංස්කෘතිය හා සෞන්දර්ය අධ්‍යයනය (Culture and Aesthetic Studies) |
| 07 | සංගීතය (Music) |
| 08 | පාලි (Pali) |
| 09 | සිංහල (Sinhala) |
| 10 | සංස්කෘත (Sanskrit) |
| 11 | හින්දි (Hindi) |
| 12 | මානව විද්‍යාව (Anthropology) |
| 13 | පුරාවිද්‍යාව (Archeology) |
| 14 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය (Communication and Media Studies) |
| 15 | අපරාධ විද්‍යාව (Criminology) |
| 16 | ආර්ථික විද්‍යාව (Economics) |
| 17 | භූගෝල විද්‍යාව (Geography) |
| 18 | ඉතිහාසය (History) |
| 19 | ජාත්‍යන්තර සම්බන්ධතා (International Relationships) |
| 20 | දර්ශනය (Philosophy) |
| 21 | දේශපාලන විද්‍යාව (Political Science) |
| 22 | මනෝ විද්‍යාව (Psychology) |
| 23 | සමාජ සංඛ්‍යානය (Social Statistics) |
| 24 | සමාජ විද්‍යාව (sociology) |

i. ඉහත දක්වා ඇති විෂයයන්ගෙන් විෂයයන් 03 ක් තෝරාගත යුතුය.

ii. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ විෂයයක් වශයෙන් සංගතය හෝ නර්තනය සඳහා ලියාපදිංචි වීමට නම් විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ ද සමත්වීම අනිවාර්ය වේ. ප්‍රායෝගික පරීක්ෂණයෙන් අසමත් වන සිසුන්ට ඒ වෙනුවට වෙනත් විෂයයක් තෝරා ගත හැකිය.

iii. නර්තනය විෂයය සඳහා ලියාපදිංචි වන සිසුන්ගෙන් ප්‍රායෝගික පුහුණු සඳහා අමතර ගාස්තුවක් අය කෙරේ.

iv. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ විෂයයක් වශයෙන් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමට අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණය සඳහා ජනසන්නිවේදනය විෂයය හදාරා තිබිය යුතුය.

v. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට විෂයයක් ලෙස ඉංග්‍රීසි භාෂාව හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :

- අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා තම ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි විෂයය (විෂයය අංක 73) හදාරා අවම වශයෙන් 'S' සාමාර්ථයක් ලබා තිබීම.
- අනෙකුත් සියළුම අයදුම්කරුවන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

## 2. <u>සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව</u>

**ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්**

I. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වසරේ හෝ ඉන්පසු පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයයන් තුනම එකවර සමත් වී තිබීම

හෝ

2000 වර්ෂයට පෙර අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට ඇත්නම් විෂයයන් හතරම එකවර සමත් වී තිබීම

හෝ

II. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන භූගෝලීය තොරතුරු පද්ධති හා දූරස්ථ සංවේදය (GIS & Remote Sensing) ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම (SLQF Level 3 / NVQ Level 5)

හෝ

III. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී තිබීම (SLQF Level 3 / NVQ Level 5)

## 3. <u>Bachelor of Arts in English (General) External Degree\</u>

### Eligibility to apply for selection test:

- Those who have obtained a minimum of three 'S' passes for any three subjects of the G.C.E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka, in or after 2000

OR

- Those who have obtained a minimum of four 'S' passes for any four subjects of the G.C.E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka, before 2000

OR

- Those who have obtained the Certificate of Teacher Training or Diploma in Teaching from a National College of Education (of the National Institute of Education, Ministry of Education, Sri Lanka), with a minimum of 4 Credit passes for the following subjects: Linguistics and Introduction to Phonology, English Language, English Language Teaching Methodology and English Literature

OR

- Those who have obtained a minimum of three passes for any three subjects of the General Certificate of Education Advance Level Certificate (G.C.E. Advanced Level) of the UK Examination Boards (commonly known as London Advanced Level Examinations: Cambridge/Edexcel)

OR

Those who have obtained a Higher Diploma in English equivalent to the SLQF Level 4 of the Sri Lanka Qualifications Framework of the University Grants Commission, Sri Lanka, on the recommendation from the Department of English and Linguistics, followed by the Senate approval of the University of Sri Jayewardenepura.

## Selection Test Conducted by the Department of English & Linguistics

- It is mandatory for all prospective applicants to pass the Selection Test conducted by the Department of English and Linguistics of the University of Sri Jayewardenepura except for those who have obtained a minimum of an 'S' pass for English (subject number 73 ) from the G. C. E. Advanced Level Examination administered by the Department of Examinations of Sri Lanka.

**ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්**

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වර්ෂයට පෙර පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ විෂයයන් හතරක් සාමාන්‍ය සාමාර්ථ හතරක් සහිතව සමත් වීම.

හෝ

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වර්ෂයේ හෝ ඉන් පසු පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ විෂයයන් තුනක් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) සහිතව සමත් වීම

හෝ

- පුහුණු ගුරු සහතිකය (ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ක්‍රම, ඉංග්‍රීසි සාහිත්‍ය, වාග් විද්‍යා හා ශබ්ද විද්‍යා ප්‍රවේශය යන විෂයයන් හතරටම සම්මාන සාමාර්ථ සහිතව) රජයේ පුහුණු ගුරු සහතිකය ලබා ගෙන තිබීම

හෝ

- එක්සත් රජධානියේ විභාග මණ්ඩල විසින් පවත්වනු ලබන අ.පො.ස. උසස් පෙළ (කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල්) විභාග වලින් ඕනෑම විෂයයන් තුනක් සමත් වී තිබීම (Commonly known as London Advanced Level Examination : Cambridge/Edexel)

හෝ

- ශ්‍රී ලංකා අධ්‍යාපන යෝග්‍යතා රාමුවෙහි 4 වන සාධන මට්ටමට අදාළ උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් හදාරා තිබීම සහ එම ඩිප්ලෝමාව ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශයේ නිර්දේශය මත සනාතන සභාවෙන් අනුමත කර තිබීම

තෝරා ගැනීමේ පරීක්ෂණය :

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

- අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා තම ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් ලෙස ඉංග්‍රීසි විෂයය (විෂයය අංක 73) හදාරා අවම වශයෙන් S සාමාර්ථයක් ලබා ගෙන ඇති අයදුම්කරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණයට සහභාගී විය යුතු නැත.

## කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය යටතේ ක්‍රියාත්මක වන බාහිර උපාධි පාඨමාලා

### 1. <u>වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව</u>

**ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්**

(අ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස පෙළ) පරීක්ෂණයෙන් ඕනෑම විෂයයන් තුනක් එක් වතාවකදී සමත් වීම.

හෝ

(ආ) වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධියට අදාළ පරීක්ෂණ සඳහා බාහිර අපේක්ෂකයන් ලෙස ලියාපදිංචි වීම පිණිස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් මතු දැක්වෙන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

i. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වාණිජ්‍යය පිළිබඳ විශේෂ පුහුණු ගුරු සහතිකය ලබා තිබීම.
ii. ලන්ඩනයේ වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.
iii. ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය සමත් වී තිබීම.
iv. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළබඳ දෑ අවුරුදු ජාතික සහතිකය ලබා තිබීම.
v. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරීන්ගේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වී තිබීම.
vi. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.
vii. ශ්‍රී ලංකාවේ/ එක්සත් රාජධානියේ ගණකාධිකාරණ ශිල්පීය ආයතනය පවත්වන විභාගයේ (AAT) සියළුම කොටස් සමත් වී සිටීම.
viii. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ ඩිප්ලෝමාව ලබා තිබීම.
ix. එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ පරීක්ෂණවල දෙවන අදියර සමත් වී තිබීම.
x. එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත් වී සිටීම.

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා සිටීම.

හෝ

(ඈ) ඉහත සඳහන් සුදුසුකම්වලට හෝ අවශ්‍යතාවලට හෝ සමාන සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙ වාණිජ විද්‍යා අධ්‍යයනාංශ කමිටුව පිළිගත් සුදුසුකමක් ලබා සිටීම.

මෙහි (ඈ) යටතේ ලියාපදිංචිය අපේක්ෂා කරන්නන් විසින් නියමිත ආකෘති පත්‍ර මගින් ඉල්ලුම් කිරීමට ප්‍රථම ස්වකීය සුදුසුකම් පිළිබඳ විස්තර සඳහන් ලිපියක් අදාළ සහතික පිටපත් ද සමඟ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර ලේඛකාධිකාරී මගින් වාණිජ විද්‍යා අධ්‍යයනාංශ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

## 2. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව

**ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්**

(අ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් ඕනෑම විෂයයන් තුනක් එක් වතාවකදී සමත් වීම.

හෝ

(ආ) රාජ්‍ය අංශයේ ස්ථිර සේවයේ වසර 03 ක පළපුරුද්ද තිබීම සහ එකවර අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයෙන් විෂයයන් දෙකක් සමත් වීම.

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම.

හෝ

(ඈ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් මතු දැක්වෙන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

i. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් සමත් වී රජයේ පරිපාලන සේවයට ඇතුළත් වී සිටීම. (SLAS)
ii. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරීවරුන්ගේ සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගයෙන් සමත් වී රජයේ ගණකාධිකරණ සේවයට ඇතුළත් වී සටීම. (GAS)
iii. අධ්‍යාපන දෙපාර්තමේන්තු පුහුණු ගුරු සහතිකය ලබා තිබීම.
iv. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ දෑ අවුරුදු පාඨමාලාව සමත් වී තිබීම.
v. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දෑ අවුරුදු සහතිකය.
vi. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ ප්‍රථම සහ ද්විතීය වර්ෂ පරීක්ෂණ වලින් සමත් වී තිබීම.
vii. ලන්ඩන් වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රෙය සාමාජිකත්වය සාමාජිකත්වය ලබා තිබීම.
viii. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයකින් ගණකාධිකරණය පිළිබඳ ඩිල්ලෝමා සහතිකය ලබා තිබීම.

ix. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

x. ශ්‍රී ලංකාවේ හෝ එක්සත් රාජධානියේ ගණකාධිකරණ ශිල්පීය ආයතනය මගින් පවත්වන විභාගයේ (AAT) සියළුම කොටස් සමත් වී තිබීම.

xi. ශ්‍රී ලංකා යුද්ධ, නාවික හෝ ගුවන් හමුදාවේ ස්ථිර බලකායක අධිකාරීලත් ශ්‍රේණියක නිලධාරියෙකු වීම.

xii. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක හෝ ඊට ඉහළ නිලයක නිලධාරියෙකු වීම.

xiii. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

හෝ

(ඉ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි ඉහතින් නම් නොකරන ලද වෙනත් සුදුසුකම්

<u>අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්</u>

- ❖ සුදුසුකම් සනාථ කිරීමට අයදුම්පත්‍රය සමඟ අදාළ සහතික වල ඡායා පිටපත් සහතික කර එවිය යුතු අතර, වෙනත් සුදුසුකම් යටතේ ඉල්ලුම් කරනු ලබන අපේක්ෂකයින් එම සහතිකවල ඡායා පිටපත්ද සහතික කර එවිය යුතුය. (අධ්‍යාපන සහතික සහ වෙනත් සුදුසුකම් යටතේ ඇති සහතික විදුහල්පති, ඔබ සේවය කරන ආයතනයේ ප්‍රධානියා, ග්‍රාම නිලධාරී, සාමදාන විනිශ්චයකාර හෝ රජයේ විධායක නිලධාරියෙකු සහතික කළයුතුය.)

- ❖ අයදුම්කරුවන් අයදුම් පත්‍ර කැඳවනු ලබන 2019 වර්ෂයේ ජනවාරි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.

- ❖ ඉහත උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කරනු ලබන්නේ සීමිත සංඛ්‍යාවක් වන බැවින් අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා ගියහොත් අවශ්‍යතාව පරිදි ප්‍රවේශ ලිඛිත පරීක්ෂණයක් සහ/හෝ වාචික පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට සදුවේ. අපේක්ෂකයින් ලියාපදිංචිය සඳහා තෝරාගනු ලබන්නේ පරීක්ෂණ වලින් සමත්වන ප්‍රමුඛතාවය මතය.